# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2300/13 - 2022 ඔක්තෝබර් මස 05 වැනි බදාදා - 2022.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ වන නියමය

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙම නියෝගය මගින්, කලින් කලට සංශෝධනය කරන ලද 2019 දෙසැම්බර් මස 05 දිනැති 2152/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කළ නියමයේ 2 වන ඡේදය, 2022 අගෝස්තු මස 22 දිනැති 2294/26 දරන ගැසට් නිවේදනයෙන් හඳුන්වා දෙන ලද (ඔ) උප ඡේදයට වහාම පහතින් පහත උප ඡේදය එකතු කිරීමෙන් සංශෝධනය කරමි.

(ග) දේශීය සනීපාරක්ෂක තුවා නිෂ්පාදකයන් විසින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 3920.10.20 (පොලිඑතිලීන් පටල - නැප්කින් හා සනීපාරක්ෂක තුවා නිෂ්පාදනය කරන්නා වූ වර්ගයකට අයත් ලෝහ නොගැන්වූ පළල මි. මී. 110 ට වැඩි නමුත් මි. මී. 230 ට නොවැඩි), 3920.10.90 (අනෙකුත් - පොලිඑතිලීන් පටල (ඩබ්)), 3926.90.99 (අනෙකුත් - පොලිඑතිලීන් පටල), 4811.59.10 (කඩදාසි, කඩදාසි පුවරු, සෙලියුලෝස් වොඩිං සහ සෙලියුලෝස් කෙඳි වලින් තැනූ ජාල, සිලිකෝන් ආලේපනය කළ) සහ 5603.11.00 (නොවියන ලද රෙදි (බර වර්ග මීටරයට ග්‍රෑම් 25 ට නොවැඩි)) යටතේ වර්ගීකරණය වන අමුද්‍රව්‍ය හෝ අන්තර් භාණ්ඩ ආනයනය කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

මෙම නියමය 2022 ඔක්තෝබර් මස 06 දින සිට බලපැවැත්වේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 10 - 0102


1A - PG 6006 — 456 (2022/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.